HABIB BANK
හබීබ් බැංකුව
ஹபீப் வங்கி

# මූලික තොරතුරු පත්‍රය – ආමුඛ ආයෝජන ගිණුම (IIA)

| | |
|---|---|
| නිමැවුම /සේවාව පිළිබඳ විස්තර | පහත සඳහන් නම් කරන ලද මුදල් වර්ග අතරින් ඕනෑම විදේශ මුදල් වර්ගයකින් ජංගම සහ ඉතුරුම් ගිණුමක් ලෙස IIA විවෘත කළ හැක. |
| නම් කරන ලද මුදල් | - ඇමරිකානු ඩොලර් (USD)<br>- බ්‍රිතාන්‍ය පවුම් (GBP)<br>- යුරෝ (EUR) |
| ජංගම ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබන පාර්ශව | - ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වාසය කරන විජාතිකයෙක්<br>- ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකික සම්භවයක් ඇති විජාතිකයෙක්<br>- ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන ශ්‍රී ලාංකික පුරවැසියෙක්<br>- ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත කරන ලද සමාගමක්<br>- දේශීය සහ ප්‍රාදේශීය අරමුදල්, අන්‍යෝන්‍ය අරමුදල්, ඒකක භාර සහ ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපනය වී සිටින වෙනත් ආයතනික ආයෝජකයින්<br>- මියගිය පුද්ගලයාගේ දේපලෙහි පරිපාලනය අවසන් වන තෙක් එම බලයලත් වෙළෙන්දා සමඟ ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන ගිය, මියගිය පුද්ගලයාගේ දේපලෙහි අද්මිනිස්ත්‍රාසිකරුවෙකු හෝ පොල්මඃකරුවෙක්<br>- නඩු කටයුතු අවසන් වන තෙක් එම බලයලත් වෙළෙන්දා සමඟ ආමුඛ ආයෝජන ගිණුමක් පවත්වාගෙන ගිය සමාගමක ග්‍රාහකයෙකු හෝ ඈවර කරන්නෙකු.<br>- මහ බැංකුව විසින් කලින් කලට බලය පවරනු ලබන වෙනත් ඕනෑම පුද්ගලයෙකු හෝ පුද්ගල කාණ්ඩයක්. |
| අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් | - අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් පිළිබඳ විස්තර පහත සබැඳිය ඔස්සේ අපගේ වෙබ් අඩවිය හරහා බලා ගත හැක.<br>- IIA හි අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් පිළිබඳ වැඩිදුර විස්තර 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2021 මාර්තු 18 දිනැති 2021 අංක 15 හරහා බලා ගත හැක. |
| වෙනත් අයකිරීම් | අයකිරීම් සටහන සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>https://www.hbl.com/srilanka/sobc |
| ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපටිපාටිය | - ගිණුම් විවෘත කිරීමේ පෝරමය සම්පූර්ණ කරන්න (පහත සබැඳියෙන් ප්‍රවේශ වන්න.)<br>- බැංකුව විසින් ඉල්ලා සිටින සියලුම ලියකියවිලි ලබා දෙන්න |
| වෙනත් නියමයන් හා කොන්දේසි | වෙනත් නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>file:///C:/Users/uc0801/Downloads/1._HBL_AOF_-Conventional_Banking_(Bank%20copy)_(2).pdf |

HABIB BANK
හබීබ් බැංකුව
ஹபீப் வங்கி

# පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs)

| | |
|---|---|
| නිමැවුම /සේවාව පිළිබඳ විස්තර | ජංගම (චෙක්පත් අණ කිරීමේ පහසුකම නොමැතිව), ඉතුරුම් හෝ කාලීන තැන්පතු ගිණුම් ලෙස ඕනෑම නම් කරන ලද විදේශ මුදලකින් PFCA ගිණුම විවෘත කර පවත්වාගෙන යා හැක. |
| නම් කරන ලද මුදල් | - ඇමරිකානු ඩොලර් (USD)<br>- බ්‍රිතාන්‍ය පවුම් (GBP)<br>- යූරෝ (EUR) |
| ජංගම ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබන පාර්ශව | - ශ්‍රී ලංකික ජාතිකයෙකු වන බාලවයස්කාරයෙකු ඇතුළු පුද්ගලයෙක්.<br>- ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන බාලවයස්කරුවෙකු ඇතුළු ලාංකික සම්භවයක් ඇති පුද්ගලයෙක්.<br>- ශ්‍රී ලංකාවේ වාසය කරන විජාතිකයෙක්<br>- ශ්‍රී ලංකාවේ තාවකාලිකව සංචාරයක යෙදී සිටින හෝ ශ්‍රී ලංකාවට තාවකාලික සංචාරයක් සඳහා පැමිණීමට අදහස් කරන විජාතිකයෙක්<br>- මියගිය පුද්ගලයාගේ දේපලෙහි පරිපාලනය අවසන් වන තුරු එම බලයලත් වෙළෙන්දා හෝ සීමා සහිත වෙළෙන්දා සමඟ බලපත්‍රලාභී බැංකුවක පුද්ගලික විදේශ මුදල් ගිණුමක් පවතවාගෙන ගිය, මියගිය පුද්ගලයෙකුගේ දේපලෙහි අද්මිනිස්ත්‍රාසිකරුවෙක් හෝ පොල්මඃකරුවෙක්. |
| අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් | - අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් පිළිබඳ විස්තර පහත සබැඳිය හරහා අපගේ වෙබ් අඩවිය තුළින් බලා ගත හැක:<br>- 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2021 මාර්තු 18 දිනැති 2021 අංක 15 හරහා PFCA හි අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් පිළිබඳ වැඩිදුර විස්තර බලා ගත හැක. |
| වෙනත් අයකිරීම් | අයකිරීම් සටහන සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>https://www.hbl.com/srilanka/sobc |
| ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපටිපාටිය | - ගිණුම් විවෘත කිරීමේ පෝරමය සම්පූර්ණ කරන්න (පහත සබැඳියෙන් ප්‍රවේශ වන්න.)<br>- බැංකුව විසින් ඉල්ලා සිටින සියලුම ලියකියවිලි ලබා දෙන්න. |
| වෙනත් නියමයන් හා කොන්දේසි | වෙනත් නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>file:///C:/Users/uc0801/Downloads/1._HBL_AOF_-_Conventional_Banking_(Bank%20copy)_(2).pdf |

HBL HABIB BANK
හබීබ් බැංකුව
ஹபீப் வங்கி

# ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම් (BFCAs)

| | |
|---|---|
| නිමැවුම /සේවාව පිළිබඳ විස්තර | ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම් යනු විදේශ විනිමය උපයන ශ්‍රී ලංකාවේ පුද්ගලයන්ට හෝ ව්‍යාපාරිකයෙකුට විවෘත කළ හැකි ගිණුමකි. ජංගම, ඉතුරුම් හෝ කාලීන තැන්පතු ගිණුම් වශයෙන් ඕනෑම නම් කරන ලද විදේශ මුදල් වර්ගයකින් BFCA විවෘත කර පවත්වාගෙන යා හැක |
| නම් කරන ලද මුදල් | - ඇමරිකානු ඩොලර් (USD)<br>- බ්‍රිතාන්‍ය පවුම් Pound (GBP)<br>- යුරෝ (EUR) |
| ජංගම ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබන පාර්ශව | ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිකරුවෙකුගෙන් විදේශ විනිමය උපයන ශ්‍රී ලංකාවේ පදිංචි පහත සඳහන් පුද්ගලයින්:-<br>- ශ්‍රී ලංකාවේ වාසය කරන පුද්ගලයෙක්<br>- හිමිකරු හෝ හවුල්කරුවන් බහුතරයක් ශ්‍රී ලංකාවේ පදිංචිව සිටින ශ්‍රී ලංකාවේ ලියාපදිංචි තනි යිතිකාර හෝ හවුල්කාරිත්ව ආයතනයක්<br>- ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද සමාගමක්<br>- 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ විදේශීය සමාගමක් ලෙස ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත කරන ලද සමාගමක්<br>- අදාළ රේඛීය අමාත්‍යාංශයේ හෝ සුදුසු අධිකාරියක ලේකම්ගේ නිර්දේශය සහිත රාජ්‍ය ආයතනයක්<br>- නඩු කටයුතු අවසන් වන තෙක් ව්‍යාපාර විදේශ මුදල් ගිණුමක් (BFCA) පවත්වාගෙන ගිය සමාගමක ග්‍රාහකයෙක් හෝ ඇවර කරන්නෙක්,<br>- මියගිය පුද්ගලයින්ගේ දේපලෙහි පරිපාලනය අවසන් වන තෙක් BFCA පවත්වාගෙන ගිය, මියගිය පුද්ගලයෙකුගේ දේපලෙහි අද්මිනිස්ත්‍රාසිකරුවෙක් හෝ පොල්මඃකරුවෙක් |
| අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් | - අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් පිළිබඳ විස්තර පහත සබැඳිය ඔස්සේ අපගේ වෙබ් අඩවිය හරහා බලා ගත හැක.:<br>- 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2021 මාර්තු 18 දිනැති 2021 අංක 15 දරණ BFCA හි අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් පිළිබඳ වැඩිදුර විස්තර බලා ගත හැක. |
| වෙනත් අයකිරීම් | අයකිරීම් සටහන සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>https://www.hbl.com/srilanka/sobc |
| ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපටිපාටිය | - ගිණුම් විවෘත කිරීමේ පෝරමය සම්පූර්ණ කරන්න (පහත සබැඳියෙන් ප්‍රවේශ වන්න.)<br>- බැංකුව විසින් ඉල්ලා සිටින සියලුම ලියකියවිලි ලබා දෙන්න<br>- විදේශ මුදල් උපයා ගැනීමට ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා වෙනත් ලියකියවිලි |
| වෙනත් නියමයන් හා කොන්දේසි | වෙනත් නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>file:///C:/Users/uc0801/Downloads/1._HBL_AOF__Conventional_Banking_(Bank%20copy)_(2).pdf |

HABIB BANK
හබීබ් බැංකුව
ஹபீப் வங்கி

# රාජ්‍ය තාන්ත්‍රික විදේශ මුදල් ගිණුම් (DFCAs)

| | |
|---|---|
| නිමැවුම /සේවාව පිළිබඳ විස්තර | රාජ්‍ය තාන්ත්‍රික විදේශ මුදල් ගිණුම යනු විදේශ රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ගේ විදේශ මුදල් බැංකු අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇති ගිණුමකි. රාජතාන්ත්‍රික විදේශ මුදල් ගිණුම තනි පුද්ගලයන් විසින් විවෘත කර පවත්වාගෙන යා හැකි අතර, පිළිවෙළින් ඕනෑම නම් කරන ලද විදේශ මුදලකින් දේශීය බැංකු ඒකකයේ ඉතිරිකිරීම්, ජංගම (අයිරා පහසුකම නොමැතිව) හෝ කාලීන තැන්පතු ලෙස තනි හෝ සුදුසුකම් ලත් වෙනත් අයෙකු සමඟ හවුල් ගිණුම් ලෙස හෝ තබා ගත හැකිය. |
| නම් කරන ලද මුදල් | - ඇමරිකානු ඩොලර් (USD)<br>- බ්‍රිතාන්‍ය පවුම් (GBP)<br>- යුරෝ (EUR) |
| ජංගම ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබන පාර්ශව | - රාජ්‍ය තාන්ත්‍රික ගමන් බලපත්‍රයක්, විදේශ කටයුතු පිළිබඳ විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය තාන්ත්‍රික හැඳුනුම්පතක් ඇති සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන නේවාසික වීසා බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති විදේශීය පුරවැසියෙක් .<br>- රාජ්‍ය තාන්ත්‍රික නොවන විදේශ ගමන් බලපත්‍රයක් ඇති සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇති විදේශීය පුරවැසියෙක්. |
| අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් | - අවසර ලත් හර සහ අවසර ලත් ණය පිළිබඳ විස්තර පහත සබැඳිය හරහා අපගේ වෙබ් අඩවිය ඔස්සේ බලා ගත හැක<br>- 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2021 මාර්තු 18 දිනැති 2021 අංක 15 දරණ PFCA හි අවසර ලත් හර සහ අවසර ලත් බැර පිළිබඳ වැඩිදුර විස්තර බලා ගත හැක. |
| වෙනත් අයකිරීම් | අයකිරීම් සටහන සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>https://www.hbl.com/srilanka/sobc |
| ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපටිපාටිය | - ගිණුම් විවෘත කිරීමේ පෝරමය සම්පූර්ණ කරන්න (පහත සබැඳියෙන් ප්‍රවේශ වන්න.)<br>- බැංකුව විසින් ඉල්ලා සිටින සියලුම ලියකියවිලි ලබා දෙන්න |
| වෙනත් නියමයන් හා කොන්දේසි | වෙනත් නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>file:///C:/Users/uc0801/Downloads/1._HBL_AOF_-Conventional_Banking_(Bank%20copy)_(2).pdf |

HBL

HABIB BANK
හබිබ් බැංකුව
ஹபீப் வங்கி

# මූලික තොරතුරු පත්‍රය – ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRAs)

| | |
|---|---|
| නිමැවුම /සේවාව පිළිබඳ විස්තර | අනේවාසික රුපියල් ගිණුම් (NRRAs), අනේවාසික අවහිර කළ ගිණුම් (NRBAs) සංක්‍රමණික අවහිර කළ ගිණුම් (MBAs) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් (CTRA) ලෙස නැවත නම් කරන ලදී.<br>ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම යනු විදේශ විනිමය පනත යටතේ නිර්මාණය කරන ලද විශේෂ ශ්‍රී ලංකා රුපියල් ගිණුමකි. CTRA ජංගම (අයිරා පහසුකම නොමැතිව) සහ ඉතුරුම් ගිණුම් ලෙස විවෘත කර පවත්වාගෙන යා හැක. සංක්‍රමණ දීමනාව මාරු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවෙන් ලබාගත් ලියාපදිංචි අංකය සමඟ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම (CTRA) විවෘත කළ යුතුය. |
| නම් කරන ලද මුදල් | - ඇමරිකානු ඩොලර් (USD)<br>- බ්‍රිතාන්‍ය පවුම් (GBP)<br>- යූරෝ (EUR) |
| ජංගම ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබන පාර්ශව | - ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිරව පදිංචිව සිටින ශ්‍රී ලාංකිකයෙක්.<br>- ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි ශ්‍රී ලාංකික සම්භවයක් සහිත විජාතිකයෙක්<br>- ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචි විජාතිකයෙක්<br>- ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියෙක්<br>- ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි වී ඇති විදේශීය ආයතන සහ සමාගම්<br>- ශ්‍රී ලාංකික ජාතික, ශ්‍රී ලංකාවෙන් පිටත වාසය කරන පුද්ගලයෙක් |
| අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් | - අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් පිළිබඳ විස්තර පහත සබැඳිය හරහා අපගේ වෙබ් අඩවිය ඔස්සේ බලා ගත හැක. හැක:-<br>- 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2021 මාර්තු 18 දිනැති 2021 අංක 15 හරහා PFCA වල අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් කිරීම් පිළිබඳ වැඩිදුර විස්තර බලා ගත හැක. |
| වෙනත් අයකිරීම් | අයකිරීම් සටහන සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>https://www.hbl.com/srilanka/sobc |
| ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපටිපාටිය | - ගිණුම් විවෘත කිරීමේ පෝරමය සම්පූර්ණ කරන්න (පහත සබැඳියෙන් ප්‍රවේශ වන්න.)<br>- බැංකුව විසින් ඉල්ලා සිටින සියලුම ලියකියවිලි ලබා දෙන්න |
| වෙනත් නියමයන් හා කොන්දේසි | වෙනත් නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>file:///C:/Users/uc0801/Downloads/1._HBL_AOF_-_Conventional_Banking_(Bank%20copy)_(2).pdf |

HABIB BANK
හබීබ් බැංකුව
ஹபீப் வங்கி

# මූලික තොරතුරු පත්‍රය – ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් (OIAs)

| | |
|---|---|
| නිමැවුම /සේවාව පිළිබඳ විස්තර | ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් ඉතුරුම් හෝ කාලීන හෝ ජංගම ගිණුම් ආකාරයෙන් ඕනෑම නම් කරන ලද විදේශ මුදල් වර්ගයකින් විවෘත කළ හැක. මෙය නේවාසික ආයෝජකයින්ට විදේශයන්හි ආයෝජනය කිරීමට හැකි විශේෂ ගිණුමකි. ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් (OIA) සහ සුදුසුකම් ලත් විදේශීය ආයෝජන හරහා විදේශීය ආයෝජන යොමු කළ යුතුය |
| නම් කරන ලද මුදල් | - ඇමරිකානු ඩොලර් (USD)<br>- බ්‍රිතාන්‍ය පවුම් (GBP)<br>- යුරෝ (EUR) |
| ජංගම ගිණුමක් විවෘත කිරීමට සුදුසුකම් ලබන පාර්ශව | - ඇපකරයෙන් සීමා වූ සමාගමක් හැර 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි සමාගම්<br>- ශ්‍රී ලංකාවේ ලියාපදිංචි හවුල්කාරිත්වයක්.<br>- ශ්‍රී ලංකාවේ පදිංචි පුද්ගලයෙක්.<br><br>ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට රාජ්‍ය නොවන සංවිධානයකට අවසර නොමැත<br>අවලංගු කරන ලද 2017 අංක 12 දරණ විනිමය පාලන පනතේ හෝ විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ නඩු පැවරීමකට අදාළව නීතිමය ක්‍රියාමාර්ග හෝ විමර්ශන පවතින ඕනෑම පුද්ගලයෙකුට හෝ සමාගමකට හෝ හවුල් ව්‍යාපාරයකට එවැනි ප්‍රේෂණ ලබා ගැනීමකින් තොරව අවසර ලත් ප්‍රාග්ධන ගනුදෙනුවක් සම්බන්ධයෙන් බාහිර ප්‍රේෂණ කිරීමට අවසර නොදේ |
| අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් | - අවසර ලත් හර කිරීම් සහ අවසර ලත් බැර කිරීම් පිළිබඳ විස්තර පහත සබැඳිය හරහා අපගේ වෙබ් අඩවිය හරහා බලා ගත හැක.:<br><br>- 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2021 මාර්තු 18 දිනැති 2021 අංක 15 දරණ PFCA හි අවසර ලත් හර සහ අවසර ලත් බැර පිළිබඳ වැඩිදුර විස්තර බලා ගත හැක. |
| වෙනත් අයකිරීම් | අයකිරීම් සටහන සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න<br>https://www.hbl.com/srilanka/sobc |
| ගිණුමක් විවෘත කිරීමේ ක්‍රියාපටිපාටිය | - ගිණුම් විවෘත කිරීමේ පෝරමය සම්පූර්ණ කරන්න (පහත සබැඳියෙන් ප්‍රවේශ වන්න.)<br>- බැංකුව විසින් ඉල්ලා සිටින සියලුම ලියකියවිලි ලබා දෙන්න |
| වෙනත් නියමයන් හා කොන්දේසි | වෙනත් නියමයන් සහ කොන්දේසි සඳහා කරුණාකර පහත සබැඳිය බලන්න:<br>file:///C:/Users/uc0801/Downloads/1._HBL_AOF__Conventional_Banking_(Bank%20copy)_(2).pdf |
| | |